# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,793 - 2013 ජනවාරි මස 11 වැනි සිකුරාදා - 2013.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
| --- | --- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 50 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 50 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 53 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජනවාරි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# බඩු බාහිරාදිය විකිණීම්

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

පාවිච්චියෙන් ඉවත්කර ඇති භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පාවිච්චියෙන් ඉවත් කරන ලද පහත දැක්වෙන භාණ්ඩ 2013 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා දින පෙරවරු 10.30ට පොල්හේන්ගොඩ අංක 163 හි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :-

1. විවිධ වර්ගවලට අයත් පුටු
2. විවිධ වර්ගවලට අයත් කාර්යාල මේස
3. වානේ අල්මාරි
4. වානේ කබඩ්
5. විවිධ වර්ගයේ රාක්ක
6. ටයර්
7. ෆැක්ස් යන්ත්‍ර
8. පරිගණක උපාංග
9. වායුසමීකරණ යන්ත්‍ර
10. විදුලි පංකා
11. හානි වූ ධන/සෘණ සේයාපට.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2012 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 163,
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

01-408

---

# රජයේ නොවන දැන්වීම්

**ඩබ්ලිව් ඇන්ඩ් පී ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2012 දෙසැම්බර් මස 12 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 89876 යටතේ "ඩබ්ලිව් ඇන් පී ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු

අංක 28, (2 වැනි තලය),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

01-321/1

**මාරාජා (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2012 දෙසැම්බර් මස 03 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 89705 යටතේ "මාරාජා (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 18/1, ආචාර්ය ඊ. ඒ. කුරේ මාවත, කොළඹ 05 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

අංක 28, (2 වැනි තලය),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

01-321/2

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

බද්දේගම, ඉඳිගස්කැටිය, රජයේ නිවාස අංක 07 හි පදිංචි ඇක්මන් මුදලිගේ වන මාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් බද්දේගම, ඉඳිගස්කැටිය, රජයේ නිවාස අංක 4 හි පදිංචි හොරගම්පිට බාලගමගේ ඉන්ද්‍රානි යන අයට බද්දේගම ප්‍රසිද්ධ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. ඩී. ලියනගේ මහතා විසින් වර්ෂ 2009 ජුනි මස 14 වැනි දින ලියා සහතික කළ අංක 1906 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් පත්කොට තිබූ අතර ඉහත කී බලපත්‍රයෙන් දී ඇති විශේෂ ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන අතර ඉහත කී මාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් ඉහත කී හොරගම්පිට බාලගමගේ ඉන්ද්‍රානි යන අය මෙතැන් පටන් තවදුරටත් ක්‍රියා නොකරන අතර එකී පත්වීම අවලංගු සහ බලරහිත බවට ඇක්මන් මුදලිගේ වන මම ප්‍රකාශ කරමි.

ඇක්මන් මුදලිගේ.

2012 නොවැම්බර් මස 20 වැනි දින.

01-332

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද නම හා අංකය දරන සමාගම, 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව දැනුම් දෙමි :-

1. සමාගමේ නම : කොග්නෙට් (පුද්ගලික) සමාගම
2. සංස්ථාගත කළ දිනය : 2012 නොවැම්බර් මස 26 වැනි දින
3. සමාගමේ අංකය : පී වී 89565
4. ලියාපදිංචි ලිපිනය : අංක 31ඒ, බෝධිය පාර, මිරිහාන, නුගේගොඩ.

ඒ. එම්. ඊ. බී. අතපත්තු,
සමාගම් ලේකම්.

2012 දෙසැම්බර් මස 24 වැනි දින දී ය.

01-303

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : ජේ. ජේ. ආරොන් රිචර්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 129/3, ධවලසිංහාරාම පාර, මුතුවැල්ල, කොළඹ 15
අංකය : පී වී 89701
ලියාපදිංචි කළ දිනය : 2012 දෙසැම්බර් මස 03 වැනි දින.

සමාගම් ලේකම්.

01-301

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම දෙනා වෙත දන්වා සිටින වග මෙසේ ය. ඇහැළියගොඩ, විපුලහේන මාවත තිලක් කඩේ අංක 242 ඒ දරන ස්ථානයෙහි පදිංචි අංක 686932010 V දරන ජාතික හැඳුනුම්පත හිමි අලුතපස්පේඩි හේවාදූරගේ ශ්‍රියාලතා වන මම මා විසින් ඇහැළියගොඩ විපුලහේන මාවත තිලක්කඩේ අංක 242 ඒ දරන ස්ථානයෙහි පදිංචි අංක 886381018 V දරන ජාතික හැඳුනුම්පත හිමි මුදුන්කොටුව ආරච්චිගේ චතුරිකා සඳමාලි යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් කැළණිය ගෝනවල පාර පදිංචි සුජානි ජයවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් 2007.08.29 වැනි දින ලියා සහතික කරන ලද අංක 275 දරන ඇටෝර්නි බලපත්‍රය මත එකී මාගේ ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක්, පෙනී සිටීමක්, ගණුදෙණුවක් සම්බන්ධයෙන් මා වග නොකියන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01-315

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

පේරාදෙණිය, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අංක 654/5 හි පදිංචි පුංචි බණ්ඩාගේ රන්ජිත් දිසානායක වන මම මහනුවර ප්‍රසිද්ධ නොතාරිස්, එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 14 වැනි දින ලියා සහතික කළ අංක 504 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පේරාදෙණිය, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 654/5 හි පදිංචි විජේසූරිය ආරච්චිගේ ඉන්දික ප්‍රිය විජේසූරිය යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2012ක් වූ නොවැම්බර් මස 29 වැනි අද දින පටන් මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

එබැවින් මින් පසු අංක 504 දරන එකී ඇටෝර්නි බලපත්‍රය භාවිතා කරමින් මාගේ එකී ඇටෝර්නි බලකරු විසින් සිදු කරනු ලබන කිසිදු නෛතික හෝ වෙනත් ඕනෑම කටයුත්තක් සම්බන්ධයෙන් මාගේ වගකීමක් සහ හෝ බැඳීමක් නොමැත.

පුංචි බණ්ඩාගේ රන්ජිත් දිසානායක.

2012 නොවැම්බර් මස 29 වැනි දින.
01-316

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : දිගන ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 88384
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.10.04
ලියාපදිංචි කාර්යාලය : අංක 356, මිල්කෝ පාර, නව නගරය, දිගන, රජවැල්ල, මහනුවර.

එම්. එස්. ෆයිසාර් අලි,
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස් සහ සමාගම් ලේකම්.

අංක 76/1, බංගලාවගෙදර,
මඩවල කඩවීදිය, මහනුවර.
01-342

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

මෙහි පහත අත්සන් කරන වැලිවේරිය, පාසැල් වත්ත, අංක 18 හි පදිංචි හෙට්ටියාදුර රංජනී හේමලතා සිල්වා වන මා විසින් වැලිවේරිය පාසැල් වත්ත, අංක 18 හි පදිංචි ඉනායි රූබන් සිල්වා වෙත දෙනු ලැබූ චිත්‍රානි පී. ගනේපොල ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් වර්ෂ 2007.06.18 ලියා සහතික කළ අංක 13304 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2012.12.19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කොට ශූන්‍යකර බලරහිත කරනු ලැබේ. මෙතැන් සිට එකී වැලිවේරිය, පාසැල් වත්ත, අංක 18 පදිංචි ඉනායි රූබන් සිල්වා විසින් වැලිවේරිය, පාසැල් වත්ත, අංක 18 හි පදිංචි හෙට්ටියාදුර රංජනී හේමලතා සිල්වා යන අය වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධව ඉහත නම් සඳහන් හෙට්ටියාදුර රංජනී හේමලතා සිල්වා යන අය වගකියනු නොලැබේ.

හෙට්ටියාදුර රංජනී හේමලතා සිල්වා.

01-344

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුව කරන දැන්වීමයි

ව්‍යාපාරයේ නම : විගර්ස් ලංකා කෙමිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 89842
ලියාපදිංචි කළ දිනය : 2012.12.12
ලිපිනය : අංක 326/ඒ 33, සමුපකාර මාවත, පැලන් වත්ත, පන්නිපිටිය.

ඩබ්. චමිල ප්‍රියලාල්,
සමාගමේ ලේකම්.

01-350

---

### ඇටෝර්නි බලපත්‍රය සහ ගිවිසුම් අවලංගු කිරීම

රත්නපුර, ලෙල්ලෝපිටිය, දිප්පිටිගල, අංක 31, මංගලගිරිහි පදිංචි දියගම මුදියන්සේලාගේ චූලනී අනුරාධා සෙනවිරත්න වන මට අයත් SG-ND-8015 දරන අශෝක ලේලන්ඩ් වර්ගයේ බස් රථයේ අයිතිය සහ NTCF-11469 දරන මාර්ග බලපත්‍රයට අදාළ කටයුතු සිදු කිරීම සඳහා මා විසින් ඕපනායක මාදොල විදුල ස්ටෝර්ස් හි පදිංචි නාපාවල ගම්ලද්දලාගේ සමන් චන්ද්‍රසිරි ජයසේන යන අය වෙත බලය පවරමින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ගාමිණී රත්නායක මහතා විසින් 2012.12.10 වැනි දින ලියන ලද 1198 දරන ඌව සබරගමුව කලාප කාර්යාලයේ 9 වැනි කාණ්ඩයේ 83 වැනි පත්‍රිරුවේ 1244 දරන දින පොත් අංක යටතේ ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රය සහ ගිවිසුම 2012.12.11 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මෙයට,

ඩී. එම්. චූලනී අනුරාධා සෙනෙවිරත්න.

2012 දෙසැම්බර් මස 11 වැනි දින.

01-386

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : රන්සවි කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 66/20, 3 වැනි පටුමග, නව ගාලු පාර, කොරළවැල්ල, මොරටුව
අංකය : පී වී 89971
ලියාපදිංචි කළ දිනය : 2012 දෙසැම්බර් මස 17 වැනි දින.

සමාගම් ලේකම්.

01-378

---

### නිවේදනයයි

වර්ෂ 2002 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්ති ප්‍රකාර ක්ලියර් පොයින්ට් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2012 අප්‍රේල් මස 4 වැනි දින සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ක්ලියර් පොයින්ට් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමටඩ්
සමාගමේ අංකය : පී වී 85348
ලියාපදිංචි කාර්යාලය : අංක 1, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලය.

01-311

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - අකුරැස්ස ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2013.02.06 වැනි දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරලයේ, මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමට කේ. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද 1987.02.06 දිනැති අංක 9/87 දරන පිඹුර ප්‍රකාර, බෙදා වෙන් කරන ලද අංක 74 දරන ඉඩම් කැබැල්ලට 1995.02.25 දිනැති එකී මිනින්දෝරු මහතාගේ අංක 56/1995 දරන උධෘත පිඹුර ප්‍රකාර පර්චස් විසිහතයි දශම එකක් (අක්. 0 රූඩ් 0 පර්. 27.1) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි යනාදී සියලු දෑය ද වේ.

02. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමට 1987.02.06 දිනැති කේ. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 9/87 දරන පිඹුර ප්‍රකාරව, බෙදා වෙන් කරන ලද අංක 47 දරන පර්චස් තිස්හයයි දශම දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 36.2) විශාල ඉඩම් කැබැල්ල පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ මාර්ග පරවශ්‍යතා අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2012.06.08 දිනැති *රජයේ ගැසට් පත්‍රයේද*, 2012.10.08 වැනි දින "දිනමිණ" පුවත්පතේ ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - මාලිම්බඩ, කිරිමැටිමුල්ල හන්දියෙන් වමට ඇති අකුරුගොඩ පාරේ මීටර් 500ක් පමණ ගොස් දකුණට හැරී මීටර් 300ක් පමණ ඉහළට යන විට හමුවන අලස්වත්තේ මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් (10%) ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (දින 30) ඇතුළත මාතර, නූපේ, අනගාරික ධර්මපාල මාවත, අංක 215 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතු ය.

දුරකථන අංක : 041-2222792, 2222822 හා 2224773,
ෆැක්ස් අංකය : 041-2222688.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516.

01-379

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පෝස්ට් ග්‍රැජුවට් ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0004 1001 5323.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012 ඔක්තෝබර් මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ අනූ දෙදහස් හත්සිය තුනයි ශත අනූ එකක (රු. 5,392,703.91) මුදල ද, 2012 සැප්තැම්බර් මස 11 වැනි දින අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂ තිස් තුන් දහස් හත්සිය එකොළහයි ශත තිස් තුනක (රු. 5,033,711.33) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2012.12.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2012.12.03 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.02.11 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර- කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ වැලිකඩ සහ නාවල පිහිටි "ගොඩපරගහපිල්ලෑව සහ ගොඩපරගහකුඹුර නොහොත් ඇලමගේ කුඹුර, ඇලබොඩපිල්ලෑවේකුඹුර, තොටුපොලකුඹුර, වැලිපොතවගුර නොහොත් කුඹුර, හල්පොතකුඹුර, මීදැල්ලගහකුඹුර, නොහොත් හල්පොතකුඹුර වැලිපිටපිල්ලෑව කුඹුර නොහොත් කජුගහකුඹුර සහ මුල්ලේකුඹුර යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන නලින් හේරත් යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 18 වැනි දාතම හා අංක 2006/453 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් $54^{A}$ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්

උතුරට : අංක 1385 දරන පිඹුරේ ලොට් 90 (අඩි 20 පළල පාර) නැගෙනහිරට: ලොට් 54B දකුණට : අංක 3665 දරන පිඹුරේ ලොට් 6 (මාර්ග වෙන්කිරීම) සහ බස්නාහිරට : අංක 1350 දරන පිඹුරේ ලොට් 53 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම නමයයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 6.92) හෝ හෙක්ටයාර් 0.0175ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2006/453 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එම් 3305/137 යටතේ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර යන අය විසින් සාදන ලද 2002 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 1350 දරන පිඹුරේ ලොට් 90.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-381